ලිංගික අපරාධයක චූදිතයාගේ අනන්‍යතාවය සමග ලිංගික අපයෝජනයකට ලක්වූ බාලවයස්කරු සහ චූදිතයා අතර වන ඥාතීත්වය සඳහන් කිරීම ඔස්සේ වක්‍රාකාරයෙන් බාලවයස්කරුගේ අනන්‍යතාවය හෙළිවන බැවින්, බාලවයස්කරු හා චූදිතයා අතර ඥාතීත්වය සඳහන් නොකළ යුතු බවද මාධ්‍ය ආචාර ධර්මයන්හි සඳහන් වේ. පහත පුවත් වාර්තාවන්හි දැක්වෙන සිදුවීම මින් වසර විස්සකට පමණ ඉහතදී සිදුවූවක් වේ. එනමුත්, ලිංගික අපරාධයකට ලක්වූවෙකුගේ අනන්‍යතාවය හෙළි නොකළ යුතුය යන පදනමේ සිට ගත් විටද, මෙහි චූදිතයාගේ නාමය සහ චූදිතයා විසින් වින්දිතයාට දක්වන ඥාතීත්වය හෙළිදරවු කිරීම ආචාර ධර්ම විරෝධී නොවන්නේ දැයි ඇසීමට සිදුවේ.

ලිංගික අපරාධයක්/අපයෝජනයක් හැඳින්වීමට දූෂණය යන්න බොහෝ විට භාවිතා වන අතර ලිංගික අපරාධයක් හැඳින්වීම සඳහා නීති පොත් තුළද සඳහන් වන්නේ දූෂණය යන්නයි. කෙසේ නමුත් ගැටළුව වන්නේ, දූෂණය යන යෙදුම සමගින් වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය වීමයි. දූෂණය යන යෙදුමත් සමගින් ලිංගික අපරාධයකට ලක්වූ වින්දිතයෙකුට මුහුණ පෑමට සිදුවන සමාජ ගර්හාව හා කොන් කිරීමටද එම ගම්‍යාර්ථය හේතුසාධක නොවේදැයි අප විමසිය යුතුවේ. එනිසා, මෙවැනි අවස්ථාවක යොදාගැනීමට වඩාත් සුදුසු වන්නේ ලිංගික අපරාධය හෝ බාලවයස්කරුවෙකු සම්බන්ධයෙන් නම් ලිංගික අපයෝජනය යන්නයි.

මීට අමතරව ලිංගික අපරාධයක්/අපයෝජනයක් හැඳින්වීම සඳහා "බාප්පා දැරිය බිලි ගනියි" වැනි සිරස්තලයක් යොදාගැනීම ඔස්සේ එම වින්දිතයා විනාශ වූවාක් වැනි අර්ථයක් නොලැබෙන්නේදැයි අප සිතිය යුතු වේ.

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna #Mawbima